විධිමත්වූත් කාර්යක්ෂමවූත් පොදු ජන සුභ සාධනයට පළාත් පාලනය

# නිවිතිගල ප්‍රාදේශීය සභාව
# நிவித்திகல பிரதேச சபை
# Nivitigala Pradeshiya Sabha

මගේ අංකය :- ඔබේ අංකය :- දිනය :- 2023.04.06
My Ref Your Ref Date

විගණන අධිකාරී,
විගණන අධිකාරී කාර්යාලය,
රත්නපුර මහ නගර සභාව,
රත්නපුර

<u>නිවිතිගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව</u>

ඉහත සඳහන් කරුණට අදාලව මා වෙත එවන ලද ඔබගේ සමාංක SGLG/RT/A/NVPS/FA/05/2022/10 හා 2023.03.29 වන දින දරණ විගණන වාර්තාව හා බැදේ.

02.ඒ සඳහා අදාල පිළිතුරු මේ සමග අමුණා කාරුණිකව ඉදිරිපත් කරමි.

එම්.කේ පුෂ්පකුමාරි
ලේකම්,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල

***Tele :-045-2279275 Fax:-045-2279275 E-Mail :-nivitigalaps@gmail.com Web Address:- www.nivitigala.ps.gov.lk***
***කාර්යාලය:- නිවිතිගල ප්‍රාදේශීය සභාව, නිවිතිගල Office:- Nivitigala Pradeshiya Sabha, Nivitigala.***

1.4.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) 2023.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ස්ථාවර වත්කම් පොළිය අඩුවෙන් සටහන් කිරීම නිවැරදි කිරීමට සටහන් කර ගතිමි.

(ආ) 2023.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි.

(ඇ) 2023.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි.

(ඈ) 2023.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි.

(ඉ) 2023.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි.

(ඊ) 2023.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි.

(උ) හිඟ වැටුප් හා දීමනා සකස් කිරීමට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් පිහිටුවන ලද කමිටුව මගින් ගෙවිය යුතු හිඟ වැටුප් හා දීමනා සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතින අතර අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කොට ඇත.ගෙවිය යුතු හිඟ වැටුප් කඩිනමින් නිශ්චය කර 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි.

.

1.4.2 <u>විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂයට අදාල උපලේඛන පහතින් සඳහන් කරන අතර ලෙජරයේ ශේෂය සමග වෙනස් වීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව හා ලී බඩු හා සවිකිරීම්,යන්ත්‍ර හා උපකරණ ගිණුම් වලට අදාල ශේෂයන් තහවුරු කිරීමට අවශ්‍ය උපලේඛනද ඉදිරිපත් කරන බව දන්වා සිටිමි.

<u>2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසන් ගිණුම සකස් කිරීමේදී මෝටර් රථ ගිණුම් ශේෂය තහවුරු කිරීම</u>

| අනු අංකය | රථයේ ලියාපදිංචි අංකය | රථයේ වර්ගය | වටිනාකම-රු |
|---|---|---|---|
| 01 | 250-0584 | ඩබල් කැබ්රථය | 1,145,000.00 |
| 02 | WPPF-7440 | ඩබල් කැබ්රථය | 6,390,000.00 |
| 03 | SGQU-0872 | ත්‍රීරෝද රථය | 344,690.00 |
| 04 | WPLL-7018 | ඩම්ප් රථය | 8,500,000.00 |
| 05 | SGRS-0780 | බැක්හෝ ලෝඩරය | 5,400,000.00 |
| 06 | SGRC-1400 | ට්‍රැක්ටරය | 810,000.00 |
| 07 | SGRW 2077 | ටේලරය | 280,000.00 |
| 08 | SGRD-1649 | ට්‍රැක්ටරය | 1,750,000.00 |
| 09 | SGRW-8883 | ටේලරය | 265,000.00 |

| | | | |
|---|---|---|---|
| 10 | SGGX-4482 | නිව් හොලන්ඩ් ට්‍රැක්ටර් | 883,750.00 |
| 11 | WPLF-4828 | කැබ්රථය | 1,319,050.00 |
| 12 | SGRD-8011 | ජල බවුසරය | 1,675,000.00 |
| 13 | SGRX-2007 | ජල බවුසරය | 400,000.00 |
| 14 | SGRD-5105 | ට්‍රැක්ටරය | |
| 15 | RW -9494 | ගලි බවුසරය | 1,675,000.00 |
| 16 | SGRD-9441 | ට්‍රැක්ටරය | 3,725,150.00 |
| 17 | SGRE-2266 | ට්‍රැක්ටරය | 1,752,150.00 |
| 18 | SGRX-4394 ටේලරය | කම්පැක්ටරය | 2,000,000.00 |
| 19 | | පාපැදිය-ලුමාලා | 8,500.00 |
| 20 | විල්බැරෝ | | 9,300.00 |
| 21 | SGRY7872 | ටේලරයක් | 385,000.00 |
| 22 | 250-0584 | කැබින් කොටස | 1,410,000.00 |
| 23 | | කසල ප්‍රවාහන අත් කරත්තය | 42,500.00 |
| | **මෝටර් රථ හා කරත්ත වටිනාකම** | | **40,127,590.00** |
| | වෙන්දේසියෙන් ඉවත් කරන ලද වාහන වටිනාකම | | 2,236,300.00 |
| | **2022.12.31 දිනට තිබිය යුතු ශේෂය** | | **37,891,290.00** |

2.<u>මුල්‍ය සමාලෝචනය</u>

2.2 <u>ආදායම් පරිපාලනය</u>

## <u>2.2.1ඇස්තමේන්තු ගත ආදායම,බිල්කළ අදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් සහ 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| වැය ශීර්ෂය | විස්තරය | ඇස්තමේන්තු ආදායම | සත්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|---|
| 1-11 | වරිපනම් බදු | 1,786,777.00 | 1,827,375.74 | (40,598.74) |
| 1-12 | අක්කර බදු | 84,142.00 | 64,942.30 | 19,199.70 |
| 2-13 | කසල බදු | 50,000.00 | 0 - | 50,000.00 |
| 2-16 | **කර්මාන්ත** බදු | 653,510.00 | 727,000.00 | (73,490.00) |
| 6-15 | විනෝද බදු | 0 | 26,000.00 | (26,000.00) |
| | එකතුව | 2,574,429.00 | 2,645,318.04 | (70,889.04) |

- 2022 **වර්ෂයේ** වරිපනම් හා බදු අංශයේ රැස්කළ ආදායම අයවැයගත ආදායමට වඩා වැඩි වීමට හේතුව වුයේ වරිපනම් බදු ඇස්තමේන්තු කරනු ලබන්නේ **ප්‍රවර්ථන** ආදායම පමණක් වන අතර රැස්කල ආදායම ගණනය කිරිමේදි හිඟ ආදායම ද ගණනය කරනු ලබන බැවින් වේ.

- අක්කර බදු අයකළ යුතු නමුත් හඳුනා ගත නොහැකිව දීර්සකාලීනව පැවතෙන අක්කර බදු ඒකකයන් පැවතීම හේතුවෙන් ආදායම් අයකර ගැනීමට නොහැකි වී ඇත.

- 2-16 **කර්මාන්ත** බදු සමික්ෂණය සිදු කරන විට නොපැවති ව්‍යාපාර බදු අය කරන කාලය වන විට ආරම්භ කිරිම මත මෙම ආදායම වැඩි වි තිබේ.

- පෙර වර්ෂ වල විනෝද බදු ඇස්තමේන්තු ගත කොට තිබුණද ආදායම් අයකර ගත හැකි අවස්ථා නොතිබුණ හෙයින් විනෝද බදු ඇස්තමේන්තු නොකළ අතර පැවති සෞඛ්‍ය සීමාවන් සහ ආර්ථිකමය ගැටළු තරමක් දුරට අවම වී ඇති නිසා නිවිතිගල මහජන ක්‍රීඩාංගනය අසල පැවැත්වූ සර්කස් සංදර්ශනය වෙනුවෙන් විනෝද බදු අයකරන ලදි.

<u>කුලී ආදායම අඩු විමේ වෙනසට පහත හේතුන් සඳහන් කරමි.</u>

| බදු කුලි | | ඇස්තමේන්තුගත ආදායම | සත්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|---|
| 3-25 | **මාර්ග** තලනය බැකෝයන්ත්‍රය කුලියට දිමෙන් ලබන ආදායම | 247,000.00 | 156,700.00 | 90,300.00 |
| 3-22 | ජල සම්පාදන මණ්ඩල ඉඩමෙන් පොදු වෙළඳපල කඩකාමර | 7,158,600.00 | 1,965,491.50 | 5,193,108.50 |
| 5-23 | මස් මාළු හා සතිපොළ කඩ කාමර කුලිය | 4,616,100.00 | 3,905,122.85 | 710,977.15 |
| 5-25 | බස්නැවතුම්පල කුඩ කුලි | 1,022,000.00 | 1,464,500.00 | (442,500.00) |
| 6-25 | ක්‍රීඩා පිටිය කුලියට දිමෙන් ලබන ආදායම | 10,000.00 | 26,000.00 | (16,000.00) |
| | | 13,053,700.00 | 7,517,814.35 | 5,535,885.65 |

- බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කටයුතු සඳහා යොදා පැවතිම හේතුවෙන් එහි සේවාව ලබාදිමට නොහැකි විය.

- පවතින ආර්ථික තත්වය නිසා සංවර්ධන කටයුතු සිමා වි ඇති බැවින් මෙම යන්ත්‍රවල සේවාව ලබාගැනිමට පැමිණෙන සේවාදායකයින් පිරිස අවම වීම.

- පවතින ආර්ථික අර්බුදය හමුවේ වෙළඳාම් අඩාල වීම නිසා මස්,මාළු,සතිපොළ කඩ වෙළඳුන්ගේ ඉල්ලීම මත ආණ්ඩුකාරතුමා වෙත කඩකුලී නිදහස් කිරීමට යොමු කිරීමෙන් පසු කුලිය ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කඩකුලී නිදහස් කල මුදල රු.936,038.00 කි.

- රට තුළ පැවති ඉන්ධන අර්බුදය නිසා සතිපොළ වෙළඳුන් පැමිණිම සහ වෙළඳාම් කටයුතු අඩාල වීම නිසා සතිපොළ ගාස්තු ඇස්තමේන්තු මුදලට වඩා අඩුවෙන් ලැබී තිබුණි.

- සෞඛ්‍යමය නීතිරිති මත ක්‍රීඩා පිටි වෙන්කිරීමට අවසර නොදීමට පනවා තිබු සීමාවන් ඉවත් කළ බැවින් ක්‍රීඩා තරඟ,සංදර්ශන පැවැත්වීමට අවස්ථාව ඇතිවීම නිසා ක්‍රීඩා පිටි කුලියට දීමෙන් ලද ආදායම ඇස්තමේන්තු ගත ආදායමට වඩා වැඩි වී තිබුණි.

බලපත්‍ර ගාස්තු  ආදායම අඩු වීමේ වෙනසට පහත හේතුන් සඳහන් කරමි.

| වැය ශීර්ෂය | බලපත්‍ර ගාස්තු | ඇස්තමේන්තුගත ආදායම | සත්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|---|
| 1-35 | වාහන බලපත්‍ර | 140. 00 | 60. 00 | 80. 00 |
| 1-37 | ප්‍රචාරන දැන්වීම ,පොස්ටර් | 150,000. 00 | 196,630. 00 | )46,630.00) |
| 2-31 | බලපත්‍ර ගාස්තු | 837,450. 00 | 813,000. 00 | 24,450. 00 |
| 2-37 | පරිසර බලපත්‍ර | 76,000. 00 | 17,015. 38 | 58,984. 62 |
| | | 1,163,590. 00 | 1,026,705. 38 | 136,884. 62 |

❖ වාහන බලපත්‍ර ගාස්තුහි රැස්කළ ආදායම අයවැය ගත ප්‍රමාණයට වඩා අඩු වීමට හේතු වුයේ පා පැදි භාවිතා කිරිම **වර්තමානය** වන විට ඉතා අඩු වීම හා භාවිතා කරන ලද පා පැදිද ඉතා අබලන් තත්ත්වයේ පැවතිම හේතුවෙන් ඒවා භාවිතයෙන් ඉවත් කර තිබීම වේ.

❖ පවතින තරඟකාරීත්වය හමුවේ උපකාරක පංති වල දැන්වීම පුවරු නගර සීමාව තුළ ප්‍රදර්ශනය කරන බැවින් ඒ තුළින් වැඩි ආදායමක් ලැබෙන අතර,වෙළඳ ප්‍රචාරණ ජංගම වැඩසටහන් නගරයේ පැවැත් වූ බැවින් ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවා ආදායම් රැස්කිරීමට හැකි විය.

❖ බලපත්‍ර සමීක්ෂණයේදී බලපත්‍ර නිකුත් කිරීමට සපුරා ලියයුතු අවශ්‍යතා (මහජනතාවට පීඩාකාරී) සපුරා නොමැති ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් නොකරන ලදි.පවතින ආර්ථික තත්වය හමුවේ වෙළඳාම් අඩාල වීම නිසා සමීක්ෂණයේදී හඳුනා ගත් ව්‍යාපාර වසා තිබීම නිසාත් ඇස්තමේන්තු ගත ආදායම රැස්කිරීමට නොහැකි විය.

❖ ඇස්තමේන්තු සකස් කළද මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත්  කර ඇති චක්‍රලේඛය ප්‍රාකාරව ඔවුන් වෙත පවරා ගත් ව්‍යාපාර නිසා අහිමි වූ ආදායම රු 26,600.00 කි.තවද වසා ඇති ව්‍යාපාර වලින් රු14,800.00 ක් සහ බල ප්‍රදේශයෙන් පිටතට ව්‍යාපාරික ස්ථානය රැගෙන යාම නිසා රු.4400.00 ක් මුදලක් අය කර ගැනීමට නොහැකි විය.

සේවා සඳහා ගාස්තු වැඩි වීමට හේතු පහත පරිදි වේ.

| සේවා සඳහා ගාස්තු | | ඇස්තමේන්තුගත ආදායම | සත්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|---|
| 1-41 | සැපයුම්කරුවන් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචියෙන් ලද ආදායම | 150,000. 00 | 202,697. 96 | )52,697.96) |
| 1-43 | අයකරගත හැකි ගාස්තු | 200,000. 00 | 230,004. 68 | )30,004.68) |
| 2-41 | ස්ථානිය පරිසර ගාස්තු | 45,000. 00 | 71,942. 42 | )26,942.42) |
| 2-42 | කසල ඉවත්කිරිමේ ගාස්තු,ගලි බවුසරයේ සේවය ලබාදිම | 500,000. 00 | 668,605. 00 | )168,605.00) |
| 2-43 | සංචාරක වෙළඳාම | 50,000. 00 | 46,370. 00 | 3,630. 00 |
| 2-44 | **ආයුර්වෙද** වෛද්‍ය සහතික ලබාදිම | 700. 00 | 945. 00 | )245.00( |
| 3-41 | ගොඩනැගිලි බලපත්‍ර ඉල්ලුම් පත්‍ර | 75,800. 00 | 599,801. 09 | )524,001.09) |
| 3-43 | විජි රේඛා සහතික ලබාදිම | 120,000. 00 | 90,291. 60 | 29,708. 40 |

| | | | | |
|---|---|---|---|---|
| 5-43 | රථවාහන පාලිකා ගාස්තු | 0. 00 | 33,780. 00 | )33,780.00) |
| 6-43 | පුස්තකාල සමාජික ගාස්තු | 50,000. 00 | 48,663. 00 | 1,337. 00 |
| | | 1,191,500. 00 | 1,993,100. 75 | )801,600.75) |

- 2-42-මීට පෙර **වර්ෂයන්හි** ගලි බවුසර් සේවාව ලබාදිමේදි ගලි වලක් අප සභාව සතුව නොතිබුනු අතර 2021 **වර්ෂයේ** කොම්පොස්ට් අංගනය සහිත ඉඩමෙහි ගලි වලක් ඉදිකිරිම නිසා ගලි සේවාව පෙරට වඩා සක්‍රියව ලබාදිමට හැකි වු බැවින් වැඩි සේවාලාභින් පිරිසකට එම සේවය ලබාදිමට හැකිවිය.එමෙන්ම රත්නපුර,කලවාන වැනි බල ප්‍රදේශයෙන් පිටත ඉල්ලීම් ලැබෙන නිසා ඇස්තමේන්තු ඉක්මවා ආදායම් රැසකිරීමට හැකි විය.

- 2-43-පැවති ඉන්ධන අර්බුදය නිසා සංචාරක වෙළඳාම සීමා වු නිසා අයකරන ගත හැකි ආදායම අඩු වී ඇත.

- 2-44- දේශීය වෛද්‍ය ක්‍රමය කෙරෙහි බොහෝ දෙනෙකුගේ වැඩි නැඹුරුතාවයක් දක්වන ලැබුණු බැවින් වැඩි රෝගීන් ප්‍රමාණයක් මෙම කාලය තුල ප්‍රතිකාර සඳහා පැමිණි අතර ඔවුන්ගේ අවශ්‍යතාවය මත වෛද්‍ය සහතික නිදහස් කිරිම පෙර වසර වලට වඩා වැඩි විය.

- 3-41 -ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ණය ලබා ගැනිමට යොමු වු පිරිස මෙම වසර තුළ වැඩි බැවින් ඔවුන් එම ණය ලබා ගැනිමට අවශ්‍ය ගොඩනැගිලි බලපත්‍ර ලබා ගැනිමට යොමු වීම හා අනවසර ඉදිකිරිම් පිළිබඳ සිදුකරන ලද දැනුවත් කිරිම් හේතුවෙන් වැඩි පිරිසක් බලපත්‍ර ලබා ගැනිමට යොමු විය.

| වැය ශීර්ෂය | වරෙන්තු හා දඩ | ඇස්තමේන්තු ගත ආදායම | සත්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|---|
| 1-52 | උසාවි දඩ | 2,707,916.64 | 3,373,416.65 | )665,500.01) |
| 5-52 | ප්‍රමාද ගාස්තු | 150,000. 00 | 294,654. 30 | )144,654.30) |
| 6-51 | හානි වු පොත් සඳහා අයකිරිම | 15,000. 00 | 7,503. 62 | 7,496. 38 |
| 6-52 | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු | 50,000. 00 | 76,387. 00 | )26,387.00) |
| | | 215,000. 00 | 378,544. 92 | )163,544.92) |

- 1-52 සමාලෝචිත වර්ෂයේදිම උසාවි දඩ උපලේඛණ ලිවිම මාස 6 කට වරක් සිදු කරන අතර එහිදි එම වර්ෂයේ ලැබේ යැයි අපේක්ෂිත උසාවි දඩ පුමාණය තිරණය කරනු ලබන්නේ පෙර වර්ෂයේ ලැබිම් සමගය.එබැවින් ඇස්තමේන්තු සැකසිමට පෙර නිශ්චිතව උසාවි දඩ වටිනාකම හඳුනා ගැනිමට නොහැකි බැවින් මෙහිදි ලද ආදායම හා ඇස්තමේන්තුව සමාන වි නොමැත.

<u>වෙනත් ආදායම් හි වෙනසට හේතු පහත පරිදි වේ</u>

| වෙනත් ආදායම් | | | | |
|---|---|---|---|---|
| වැය ශීර්ෂය | | ඇස්තමේන්තුග ත ආදායම | සත්‍ය ආදායම | වෙනස |
| 1-61 | පොළි | | 768. 87 | )768.87( |
| 1-62 | විකුණුම් | 100,000. 00 | 62,665. 00 | )665,110.00) |
| 1-64 | සේවක ණය පොළි | 270,000. 00 | 282,359. 25 | 35,616. 00 |
| 1-65 | ඉඩම් හුවමාරු මුද්දර ගාස්තු | 18,000,000. 00 | 16,974,935. 00 | 12,369,050. 00 |
| 2-62 | කසල විකුණුම් ගාස්තු | 600,000. 00 | 262,274. 90 | )255,735.30) |
| 3-62 | ටෙන්ඩර් පෝරම්,ගොඩනැගිලි අයදුම්පත් හිස්භාජන විකුණුම් | 30,000. 00 | 27,169. 00 | )1,766.00) |
| 1-61 | එකතුව | 19,000,000. 00 | 17,610,172. 02 | 11,481,285. 83 |

- 1-64 මෙම **වර්ෂයේ** වැඩියෙන් ණය ලබා ගැනීම හේතු කොට ගෙන පොලිය අයකර ගැනිම වැඩි විමෙන් සේවක ණය පොලි ආදායම වැඩි විය.
- 1-62 වරිපනම් නම් සංශෝධනය සහ සේවාවන් ලබා ගැනීමට පැමිණෙන සේවාදායකයන් අවම වීම නිසා ආදායම් රැස් කර ගත නොහැකි විය.
- මහජනතාව නොදිරන කසල ප්‍රතිචක්‍රියකරණ කටයුතු වලට නැඹුරු වීම සහ ජංගම රථ මගින් නොදිරන කසල වැඩි මිලට මිලදී ගැනීම නිසා නිසා නොදිරන කසල අංගනය වෙත රැස්වෙන අලෙවි කළ හැකි දෑ අවම වීමෙන් ඇස්තමේන්තු ගත මුදල රැස් කර ගැනීමට නොහැකි විය
  .
- 1-65 ඇස්තමේන්තු සකස් කරන කාලය වන විට ඉඩම් හා හුවමාරු මුද්දර ගාස්තු උපලේඛණ ලැබී නොතිබුන බැවින් මෙම **වර්ෂයේ** ලැබීම් හා සසඳා ඇස්තමේන්තු සකසන ලදි.

<u>රජයේ දායකත්වය වෙනස් වීමට හේතු පහත පරිදි වේ.</u>

| | | ඇස්තමේන්තුගත ආදායම | සත්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|---|
| 1-71A | සේවක වැටුප් **ප්‍රතිපූර්ණය** | 14877420.00 | 17592300.91 | 1785119.09 |
| 1-71 | මන්ත්‍රි දීමනා | 4500000.00 | | |
| 2.-71 | සේ.වැ.**ප්‍රතිප්‍රර්ණය** | 9242640.00 | 5372916.98 | 3869723.02 |
| 2.-72 | ආයුර්වේද ආධාර හා වෙනත් | 200000.00 | 359655.00 | -159655.00 |
| 3-71 | සේ.වැ. **ප්‍රතිපූර්ණය** | 7213020.00 | 5118390.57 | 2094629.43 |
| 5-71 | සේ.වැ. **ප්‍රතිපූර්ණය** | 432600.00 | 435976.67 | -3376.12 |
| 6-71 | සේ.වැ. **ප්‍රතිපූර්ණය** | 1913100.00 | 1522907.67 | 390192.33 |
| | එකතුව | 38378780.00 | 37784004 | (594776.00) |

- උපාධිධාරීන් රැකියා ගත කිරීමේ වැඩසටහන යටතේ බඳවා ගත් උපාධිධාරීන් අනුමත කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට සිදුවීම.

## 2.2.3 <u>වරිපනම් හා බදු</u>

(අ) රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මුල් කාර්තු තුළ දේපල තහනම සිදුකිරීමට නොහැකි වූ අතර සිව්වන කාර්තුව අවසානයේ දේපල තහනම් කිරීම සිදුකර රු 112,101.89ක මුදලක් අයකර ගෙන ඇති බව දන්වමි.එමෙන්ම 2023 වර්ෂයේ වරිපනම් දේපල නැවත තක්සේරුව සිදුකොට අවසන් කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

(අ) අක්කර බදු අයකළ යුතු නමුත් හඳුනා ගත නොහැකිව දීර්ඝකාලීනව පැවතෙන අක්කර බදු ඒකකයන් පැවතිම හේතුවෙන් ආදායම් අයකර ගැනීමට නොහැකි වී ඇත.කඩිනමින් අක්කර බදු සත්‍යයේක්ෂණයක් සිදුකොට අක්කර බදු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි.

## 2.2.2 <u>බලපත්‍ර ගාස්තු</u>

2023/02/09 වන දින පරිසර බලපත්‍ර ලබා දිය යුතු ව්‍යාපාරික ස්ථාන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණය සිදුකොට ඇත.

2.2.4 දුරකතන කුළුණු 14 න් එක් කුළුණක් පමණක් හිමි ආයතනය නිශ්චිතව හඳුනාගත නොහැකි වූ බැවින් ඒ සඳහා ගාස්තු අයකල නොහැකි විය.මේ වසරේදී එම ආයතන හඳුනාගෙන ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි.

## 2.2.6 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

2019 දෙසැම්බර් මස සඳහා රු.185,916.67 ක් සහ 2022 නොවැම්බර් මස සඳහා රු.369,166.67 ක් ලෙස උසාවි දඩ මුදල් රු.555,083.34 ක මුදල 2023.03.22 වන දින කාර්යාලයට ලැබුණි.

උපලේඛන මගින් තහවුරු කරන ලද පහත සඳහන් කාලයට අදාල මුද්දර ගාස්තු කාර්යාලයට ලැබී ඇත. 2021 ජූලි සිට දෙසැම්බර් දක්වා රු.1,0510,016.00ක මුදලින් රු. රු.1,0491,016.00 ක මුදලක් 2023.01.18 වන දින කාර්යාලයට ලැබී ඇත.

2.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පසුගිය කාලය තුළ අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා විශාල අයදුම්පත් රාශියක් ලැබීම නිසා ස්ථානීය පරීක්ෂණ කටයුතු ප්‍රමාද වූ අතර 2023/04/03 වන විට 2022 වර්ෂයට අදාල සියළු අයදුම්පත්‍ර පරීක්ෂා කර නියෝග නිකුත් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි.

**3. මෙහෙයුම්අකාර්යක්ෂමතා**

<u>3.1 කාර්යසාධනය</u>

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශීය සභාව වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා 16 ට අමතරව පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2022.01.21 දින අංක 2264 යටතේ ගැසට් පත්‍රයේ පළකර ඒ අනුව කටයුතු කරන අතර ඉඩම් අනුබෙදුම් හා ගොඩනැගිලි සැලසුම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.ඊට අමතරව පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබ 1988.08.23 දිනඅංක 520/7 දරණ ගැසට් පත්‍රයේ පළ කළ 1990.12.27 දින සබරගමුව පළාත් සභාව මඟින් අංක 642/10 දරණ ගැසට් පත්‍රයේ පළ කළ සම්මත පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 42 පිළිගෙන නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1991.08.09 දින අංක 675 ගැසට් පත්‍රයේ පළ කර ඇත.

ඒ අනුව දැනට කටයුතු කරගෙන යන අතර ඉඩම් අනුබෙදුම් සහ සතිපොළ ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කොට ඇති බවත් ඉදිරියේදී පැනවිය යුතු කාරණා සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි.

(ආ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

තෙකලා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති නමුත් ඒම ධාරිතාවයෙන් යුතු ට්‍රාන්ස්ෆෝමරයක් කොම්පෝස්ට් අංගනය අසල සවිකිරීමට අවශ්‍ය බව විදුලි බල මණ්ඩලයෙන් පවසා ඇති අතර ඒය ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇත.නමුත් මේ වනවිට හොහොර හැලීම සිදුකරන අතර මේ වනවිට පොහොර කිලෝග්රෑම් 1500 ක් පමණ හලා පැකට් කර ඇති අතර ඒම කටයුතු දෛනිකව සිදුකරනු ලබයි.බෙලර් යන්ත්‍රය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සවිකර ඇති අතර ඒ් සඳහා විදුලි සැපයුම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>
<u>සේවක පුරප්පාඩු අතිරික්තය</u>

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ප්‍රාකාරව දින 180 සම්පූර්ණ සේවකයින් ස්ථිර කිරීම සඳහා ප්‍රධා න අමාත්‍යාංශය වෙත යොමුකොට ඇති අතර අධ්‍යාපන සුදුසුකම් සපුරා නැති සේවකයින් දින 10 පුහුණු පාඨමාලාව සඳහා යොමුකොට ඉදිරි කටයුතු සිදුකොට ඇත.නමුත් මේ වන තෙක් ඒ සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව දන්වමි.

එමෙන්ම රටේ පවත්නා වත්මන් ආර්ථික තත්වය සහ රජයේ වියදම් සීමා කිරීම පිළිබඳව ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයක් අනුව නව කාර්යමණ්ඩලය අනුමත කිරීමට හෝ නව බඳවාගැනීම් සිදුකිරීමට හැකියාවක් නොමැති බවත් 03/2022 චක්‍රලේඛය මගින් අවධාරණය කර ඇති හෙයිනුත් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ හැකියාවක් නොමැති බවත් දන්වමි.

කොම්පෝස්ට් අංගනයේ කටයුතු ආරම්භ කර ඇති බැවින් ඒ සඳහා ශ්‍රමිකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් බැවින් 05 දෙනෙකුගේ අතිරික්තයන් පවතී.

## 3.3 <u>වත්කම් කළමනාකරණය</u>

(අ) <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය</u>

2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ඌණ කොඩි කණු සංඛ්‍යාව 96 ක් වූ අතර එයින් 15ක් සඳහා මුදල් අයකරගෙන ඇති බැවින් තවදුරටත් ඌණ ශේෂය වනුයේ කොඩිකණු 81 කි.කොඩි කණු 51ක් ගෙන්වා ගැනීමට නිවේදන නිකුත් කර ඇත.ඉතිරි කණු 30 ගෙන්වා ගැනීමට අවසන් නිවේදන නිකුත් කර කඩිනමින් ගෙන්වා ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
තවද ඌණ වී ඇති ගබඩා භාණ්ඩ සඳහා වගකිව යුතු අයගෙන් අදාල මුදල් 2023 අප්‍රේල් මස වැටුපෙන් අයකිරීමට කටයුතු කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

(ආ) <u>වාහන උපයෝජනය</u>

2023/01/23 දිනැති CSC/21/FR/0417 අංක දරණ ප්‍රධාන ලේකම්ගේ ලිපිය ප්‍රාකාරව පවරා ගැනිමට අදාල කටයුතු සිදුකර ඇත.

## 3.4 <u>අවිධිමත් ගනුදෙනු</u>

ගලි බවුසර් යැපීම් දීමනාව 2017 වර්ෂයේ සිටම ලබා ගෙන ඇති අතර එය ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව 2013.06.18 දිනැති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රාදේශිය සභාව සතු යුතුකම් යටතේ 22.i(ඇ) ප්‍රාකාරව අපද්‍රව්‍ය අඩුකිරීමේ,ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රියකරණය කිරීමේ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී සිටින අයට දිරිගැන්වීම් පිරිනැමීම යනුවෙන් දක්වා ඇත.එය පදනම්ව දිරිගැන්වීම් දීමනාව ලෙස රු.1000.00 ක මුදලක් අයකිරීමටත්,එය රියදුරු සහ සහයක වෙත රු.250.00 බැගින් බෙදා දීමටත් කටයුතු කර ඇත.පසුව

එය 2017 වර්ෂයේදි තීරණ ගැනීමේ කමිටුව මගින් එය රියදුරු සහයකට අමතරව විෂය නිලධාරියාට හා මහජන සෞඛ්‍ය පරීක්ෂකයද බෙදා දී යන ලෙස 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව 9.3 වගන්තියේ දැක්වෙ පරිදි තීරණය කර ඇත.ඒ අනුව එය අදාල පාර්ශව වෙත ගෙවීම් සිදුකර ඇත.

පසුව 2022 වර්ෂයේ අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති කාරක සභාව හරහා ගලි සඳහා අයකරන ගාස්තු සංශෝධනය කර යැපීම් දීමනාව පාර්ශය 05ට බෙදීමට සභාව තීරණය කරන ලදි. ඒම කරුණු පදනම්ව මෙම දීමනාව ලබා දීමට කටයුතු කරන ලදි.

## 4.<u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

### <u>4.1 අයවැය පාලනය</u>

(අ) සහ (ආ)

❖ 2022.04.26 දිනැතිව නිකුත්කරන ලද අයවැය චක්‍රලේකය ප්‍රකාරව අත්‍යවශය වියදම් පමණක් සිදුකිරීමත්,සංවර්ධන කටයුතු,මිලදී ගැනීම්,සුභසාධනික සේවාවන් සීමා කිරීමත්,අත්‍යවශ්‍යම පමණක් වියදම් දැරීමටත් සිදුවීම නිසා ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම හා වැඩි පරාසයක ඉතිරිවීම් තිබුණි.

| අනු අංකය | වැය ශීර්ෂය | කරුණු දැක්වීම |
|---|---|---|
| 01 | 105-8 | 03/2022 අයවැය චක්‍රලේඛය ප්‍රාකාරව වියදම් සීමා කිරීම නිසා මුද්‍රණ කටයුතු සීමා කරන ලදි. |
| 02 | 105(9) (I) | මේ වන තෙක් 2022 වර්ෂයට අදාල විගණන ගාස්තු බිල්පත කාර්යාලයට ලැබී නොමැත. |
| 03 | 106-1 | 101 වැය ශීර්ෂය යටතේම වැය වී ඇත. |
| 04 | 108-1 | |
| 05 | 205-3 (II) | කොම්පොස්ට් අංගනයට ජලය ලබා ගැනීමට වෙන් කර ඇතත්නිසා උල්පතක් හරහා ජලය ලබා ගන්නා බැවින් ජල ගාස්තු ගෙවීම අවශ්‍ය නැත. |
| 06 | 605-1 | පුස්තකාලයේ පොත් මිලදී ගැනීමට යන වාහනය සඳහා ගෙවීමට වෙන්කර ඇතත් ඒය සභාවේ වාහනයක් මගින් ඉටුකර ගැනීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| 07 | 605-8 | පුස්තකාලයේ විවිධ වැඩසටහන් යටතේ වෙන්කර තිබුණද වියදම් සීමා කිරීම කළ යුතු නිසා වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට නොහැකි විය. |
| 08 | 607-3 (I) | 2022.04.26 දිනැතිව නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛය ප්‍රාකාරව වියදම් සීමා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| 09 | 607-9 (I) | |
| 10 | 109(3) | |
| 11 | 309(6) | |
| 12 | 609(1) | |
| 13 | 609(2) | |